# බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ ලංකාවේ උඩරට ක්‍රිස්තියානිකරණය සහ ස්වදේශික සමයාන්තර සමාජ දෘෂ්ටිවාදමය පරිවර්තනයන් පිළිබඳ අධ්‍යයනයක්

*ආර්.එම්.එන්. සඳමාලි [1], වයි.ආර්.එම්. සචිනි පියුමිකා රාජපක්ෂ [2]*

මෙම අධ්‍යයනය හරහා 1825-1945 දක්වා යටත් විජිත ලංකාවේ උඩරට ප්‍රදේශවල ඉංග්‍රීසි ආධිපත්‍යය යටතේ ක්‍රියාත්මක ක්‍රිස්තියානි ආගම් ව්‍යාප්තිය මගින් එම ප්‍රදේශ කේන්ද්‍ර කරගත් ස්වදේශික ආගමික හා සමාජ සන්දර්භයන් දෘෂ්ටිවාදමය අතින් මෙන් ම පුද්ගල භාවිතාවන් අතින් වඩාත් පරිවර්තනය වූ ආකාරය විමර්ශනය කරනු ලබයි. විශේෂයෙන් ම බ්‍රිතාන්‍ය ක්‍රිස්තියානි මිෂනාරි ක්‍රියාකාරකම් දේශීය ප්‍රජාවට බලපෑවේ කෙසේද යන්න එහි දී විමසයි. පෙර පැවති ස්වදේශික ආගමික පිළිවෙත් සහිත ප්‍රදේශයක් වන උඩරට තුළ සමාජ පාලනය සහ සභ්‍යත්ව පරිවර්තනය සඳහා බ්‍රිතාන්‍යයන් ක්‍රිස්තියානි ධර්මය මෙවලමක් ලෙස භාවිතා කළේ කෙසේද යන්න මෙන් ම එම ක්‍රියාවලි තුළ ප්‍රදේශ ආශ්‍රිත සමාජ, ආර්ථික හා දේශපාලනික වසයෙන් එල්ල වූ බලපෑම් කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වන අතර මෙම සංස්කෘතික හා ආගමික පැනවීම්වලට ප්‍රාදේශීය ආගමික සහ සමාජ කණ්ඩායම්වල ප්‍රතිචාරය ද බ්‍රිතාන්‍ය යටත් විජිත පරිපාලනය විසින් ලංකාවේ උඩරට ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත කිරීම සඳහා යොදාගත් උපාය මාර්ග විශ්ලේෂණය කිරීම ද, සමාජ සංස්කෘතිය මත ක්‍රිස්තියානිකරණයේ බලපෑම පරීක්ෂා කිරීම සහ උඩරට ප්‍රජාවගේ ගතිකත්වය මත මිෂනාරි ක්‍රියාකාරකම්වලට දැක් වූ අනුකූලතාවට ප්‍රතිචාර වසයෙන් ස්වදේශික ආගමික කණ්ඩායම් විසින් භාවිත කරන ප්‍රතිරෝධය හා අනුවර්තන යාන්ත්‍රණයන් ගවේෂණය කිරීම ද මෙහි අරමුණු වේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අධ්‍යයන ක්‍රමවේදය වසයෙන් මෙහි දී යොදා අතර පුස්තකාල විමර්ශනය මගින් දත්ත රැස් කර ගන්නා ලදී. ඒ අනුව බ්‍රිතාන්‍ය යටත් විජිත උපාය මාර්ග සමාජ පාලනය බලාත්මක කිරීම සඳහා ආගම, පාලනය සමඟ බද්ධ වූ ආකාරය පිළිබඳ පුළුල් අවබෝධයක් අධ්‍යයනය තුළින් විශද කිරීමට හැකියාව ලැබේ. මෙම වෙනස්කම්වලට ප්‍රතිරෝධය දැක්වීමට සහ ඒවාට අනුගත වීමට දේශීය ප්‍රජාවගේ නියෝජිතායතන හා සමාජ ක්‍රියාවලිය ප්‍රශස්ත භූමිකාවක් සිදුකර ඇති බව ද හඳුනා ගැනිමට හැකියාව ලැබේ. ආගමික පරිවර්තනයේ සහ සමාජ විපර්යාසයේ සංකීර්ණතා ආමන්ත්‍රණය කරමින් මෙම අධ්‍යයනය යටත් විජිත ඉතිහාසය සහ පශ්චාත් යටත් විජිත ශ්‍රී ලාංකේය සමාජය කෙරෙහි එහි දිගු කාලීන බලපෑම පිළිබඳ අගනා අවබෝධයක් සපයන පදනම මත වැදගත්කමක් දරනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** උඩරට, ක්‍රිස්තියානිකරණය, දෘෂ්ටිවාදමය, යටත්විජිත, සමයාන්තර

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ugcnimesha4@gmail.com

[2] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. piyumikasachiniugc@gmail.com